# ලංකා හා ඇමරිකානු මාධ්‍ය දෙකක්

පසුගියදා බොරුවාහිනිය නෝර්වේ රට ගැන කෙටි වාර්තාවක් ඉදිරිපත් කළේය. මේ වාර්තාවෙන් කීමට තැත් කළේ නෝර්වීජියානුවන් මොන තරම් මානව දයාවක් ඇති ජාතියක්ද යන්නය. බොරුවාහිනියට අනුව නෝර්වීජියානුවෝ අපේ ප්‍රශ්නයක් ඔවුනගේ ප්‍රශ්නයක් බවට පත් කරගෙන ඇත. ඔවුහු මෙරට සාමය ඇති කිරීම සඳහා ඉමහත් වෙහෙසක් ගනිති. ඔවුන් නොවන්නට මේ වන විට නැවත වරක් සටන් ඇරඹෙන්නට තිබුණි. බොරුවාහිනිය ජෙහාන් පෙරේරා නම් ජාතික සාම මණ්ඩලයේ තැනැත්තකු ද කුමාර් රූපසිංහ නම් අය ද මේ වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා යොදාගෙන තිබුණි. ජෙහාන් පෙරේරා කොටි සංවිධානයේ වෙබ් අඩවියට ද ලිපි සපයන්නෙකි. ජාතික සාම මණ්ඩලය යනු මෙරට ක්‍රිස්තියානි සභා එකතුවක් මගින් පවත්වාගෙන යන ආයතනයකි. ප්‍රභාකරන් මානවවාදියකු යැයි කී කෙනෙත් ප්‍රනාන්දු බිෂොප්වරයා කලක් මේ ක්‍රිස්තියානි එකතුවේ ප්‍රධානියෙක් විය. ක්‍රිස්තියානි සංවිධානයකට වෙසක් පණිවුඩ නිකුත් කිරීමේ අයිතියක් නැතැයි අපි නොකියමු. එහෙත් මෙවර ඔවුන් වෙසක් සමයෙහි ඊනියා තිරසාර සාමයක් වෙනුවෙන් සාකච්ඡා පැවැත්විය යුතු බවට පාරවල් හරහා ධජ පතාක ඇද්දේ වෙසක් නිමිත්තෙන් ඇති වූ බුදු බැතියකින් හෝ සැදැහැවකින් හෝ නොවන බව අපි දනිමු.

කුමාර් රූපසිංහ ගැන බොහෝ දෙනෙක් දනිති. ඔහු කලක් සුනේත්‍රා බණ්ඩාරනායක මහත්මියගේ සැමියා විය. විවාහය දෙඩමීමා කරගෙන ශ්‍රී. ල. නි. පක්ෂයේ ඉහළට ගිය ඔහු ඒ පක්ෂය තුළ ඊනියා ජනවේග කල්ලියක් ඇති කරමින් බොරු සමාජවාදී අදහස් ඔස්සේ පක්ෂයේ ජාතිකත්වය දුර්වල කිරීමට උත්සාහ ගත්තේය. (විජය කුමාරතුංග මහතා ද ජනවේගයක නැතිව ඒ දෙය ම කිරීමට උත්සාහ ගත්තේය. ඔහු අවසානයේදී මහජන පක්ෂය නමින් පක්ෂයක් පිහිටුවා ශ්‍රීලනි පක්ෂයෙන් කොටසක් කඩාගෙන ඉවත් වුයේ පක්ෂය දුර්වල කරමිනි.) ශ්‍රීලනි පක්ෂයේ ජාතිකත්වය අගය කළ සාමාන්‍ය සාමාජිකයන්ට බොරු මාක්ස්වාදී මතවාද ගිල්ලවමින් ඔවුන් ජාතිකත්වයෙන් ඈත් කිරීම ඔහුගේ වෑයම විය. ඔහු පසුව ඇලර්ට නම් ජාත්‍යන්තර සංවිධානයක ප්‍රධානියකු වී බටහිරයන් වෙනුවෙන් ආසියාතික රටවල් අස්ථායී කිරීමට වෙහෙස ගත්තේය. එක් අප්‍රිකානු රටක් ඔහු හා සංවිධානය රටින් ද පන්නා දැම්මේය. බෞද්ධයකු නොවූ ඔහු විවාහ වී ඇත්තේ ස්කැන්ඩිනේවියානු කාන්තාවක සමගය. ඔවුන්ගේ ස්ථිර පදිංචිය ද ස්කැන්ඩිනේවියාවමය. ඔහු කලකට පෙර තායිලන්තයට භික්ෂූන් වහන්සේ වඩම්මා ගෙන ගොස් උන්වහන්සේලා ලවා දෙමළ ජාතිවාදය වෙනුවෙන් වැඩ කරවීමට උත්සාහ කළේය. පූජ්‍ය මාදුරුඔය ධම්මිස්සර හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේලා කිහිප නමකට පින් සිදු වන්නට හෙළිදරව් විය.

රූපසිංහට අනුව ගෙදරක ප්‍රශ්න ඇතිවන විට අසල්වැසියන් එයට මැදිහත්වීම මිනිස් ස්වභාවයකි. අපේ රටේ ප්‍රශ්නයක් ඇති බැවින් අපට සහායට නෝර්වීජියානුවන් පැමිණ ඇත. එහෙත් ඔවුහු අසල්වැසියෝ නොවෙති. මෙතරම් දුරක් ගෙවා ඔවුන් අපට සහායට පැමිණියේ ඇයි ද යන්නට කුමාර් රූපසිංහට පිළිතුරුක් වේද? විශේෂයෙන්ම අසල්වැසියන් මෙහිදී එතරම් දෙයක් කර නොමැති බැවින් නෝර්වේ රට තකහනියක් අපට ඊනියා ආධාර දීමට පැමිණ ඇත්තේ ඇයි? ඊනියා ලෝක ගම්මානය තුළ සියලු දෙනාම අසල්වැසියන්ය යන බොරුව කියා ඔහුට ගැලවීමට නොහැකිය.

නෝර්වේ රටට මෙවැනි ප්‍රශ්නයකට මැදිහත් වීමට සිදු වී ඇත්තේ ඊනියා සාමයක් ගැන නෝර්වීජියානුවන් මහත් ඕනෑකමකින් කටයුතු කරන බැවින්ද? බොරුවාහිනියට අනුව නෝර්වේ රටට ඊනියා සාමය ගැන වැඩ කරන අත්දැකීමක් ඇත. නෝර්වේ රට දැනට අවුරුදු කිහිපයකට පෙර ඊශ්‍රායලය හා පලස්තීනය අතර ඊනියා සාමයක් ඇති කිරීමට කටයුතු කෙළේය. ඉන් සාමයක් ඇති විණි ද? අද ද මැද පෙරදිග සටන ඇවිළෙයි. ඊනියා සාම කතාවලින් වැඩක් වී නම් ඒ ඊශ්‍රායලයටය. සාම කතාවල අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ ඊශ්‍රායලය බලවත් වීමය.

නෝර්වේ විදේශ ඇමැති ද ලංකාවට පැමිණ ඇති බවට බොරුවාහිනිය උදම් අනයි. මේ සුදු ජාතිකයන් ලංකාවට පැමිණෙන්නේ අපේ යහපතටද? අද සොල්හයිම්ලා හෙල්ගසන්ලා ප්‍රභාකරන් හමුවීමට යති. මේ කොටි ඊනියා සාමකතාවලට බැරි නම් ටෝකියෝ නගරයෙහි පැවැත්වීමට නියමිත ණය කතාවලට සහභාගි කරවා ගැනීමටය.

© Prof. Nalin De Silva

නෝර්වේ පමණක් නොව ජපානයද මේ කාරණයෙහි දී මැදිහත් වෙයි. ජපානයේ විශේෂ නියෝජිත අකාෂිට ද දැන් වන්නිය හොඳට හුරු පුරුදු ප්‍රදේශයකි.

කොටි සංවිධානයට ණය ලබා දීමට ජපානයත් නෝර්වේ රටත් උත්සාහ කරයි. මේ ණය ආපසු ගෙවන්නේ කොටි නොවේ. එය ගෙවිය යුත්තේ ලංකාවය. එනම් අප රටේ බදු ගෙවන්නෝය. බදුවල ස්වභාවය වන්නේ බදු වැඩිපුර ගෙවන්නේ සාමාන්‍ය ජනතාව වීමය. සාමාන්‍ය ජනතාවට ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ලිපි ගොනු නොමැති වුවත් ඔවුහු වක්‍ර බදු ලෙස භාණ්ඩ මිලදී ගැනීමේ දී සේවා සැපයීම ලබා ගැනීමේ දී බදු ගෙවති. දෙමළ ජාතිවාදීන් හා මෙරට සිවිල් පොරවල් නමින් පෙනී සිටින අය කෙතරම් කෑ ගැසුවත් මෙබඳු බදු මුදල්වලින් වැඩි ප්‍රමාණයක් ගෙවන්නෝ 75% කට වැඩියෙන් සිටින සිංහලයෝ වෙති. මෙහි ප්‍රතිඵලය වන්නේ නෝර්වේ හා ජපානය මැදිහත් වී කොටින්ට ණය ලබාදීමත් ඒ ණය සිංහලයන්ට ඉතා වැඩිවශයෙන් ගෙවීමට සිදු වීමත්ය. ණය යොදා ගෙන කොටි සිංහලයන් මැරීම සඳහා ආයුධ ගත්තද අවසානයේදී ණය ගෙවීමට සිදු වන්නේ සිංහලයන්ටමය.

නෝර්වේ රටට අවශ්‍ය වන්නේ කොටින්ට උදව් උපකාර කිරීමය. කොටි තව තවත් ඉල්ලීම් ඉදිරිපත් කිරීමට උදා වී ඇති අවස්ථාව ප්‍රයෝජනයට ගනිති. මේ ඉල්ලීම් ඉටු කළහොත් ඊළම යන්න සිහිනයක් පමණක් නොවනු ඇත. දැන් කළ යුත්තේ කුමක්ද? දැන් කළ යුත්තේ හැකි ඉක්මණින් මේ ආණ්ඩුව විසුරුවා හැරීම හෝ ජනාධිපතිනියගේ ප්‍රධානත්වයෙන් විකල්ප ආණ්ඩුවක් පිහිටුවීමය. ඒ අතර දැනගත යුතු තවත් කරුණක් වෙයි. එනම් නෝර්වේ හා ජපානය යනු ඇමරිකා එක්සත් ජනපදයේ අතකොළු පමණක් බවය.

ඇමරිකා එක්සත් ජනපදය ඊනියා සාම කතා මෙන්ම ටෝකියෝ ණය කතා පිටුපස ද සිටින ප්‍රධාන රට වෙයි. බොරුවාහිනියේ ඉන්නා බොරු පණ්ඩිතයන් සමහර විට ඒ බව නොදන්නවා විය හැකිය. එහෙත් සියල්ල සිදු වන්නේ ඇමරිකාවට අවශ්‍ය අන්දමටය. ඊශ්‍රායල් පලස්තීන ප්‍රශ්නයේදී ද නෝර්වේ ක්‍රියා කළේ ඇමරිකාවට අවශ්‍ය අන්දමටය. ලංකාවේදී ද එසේමය.

බොරුවාහිනිය ජෙහාන් පෙරේරා හා කුමාර් රූපසිංහ ආධාර කර ගනිමින් නෝර්වේ රටට සහතික ලබා දීමට දින කිහිපයකට පෙර ඇමරිකා එක්සත් ජනපදයේ ඒ. බී. සී. නම් රූපවාහිනියේ පස්වැනි නාලිකාව ලංකාවේ ගංවතුර පිළිබඳ ප්‍රවෘත්තියක් ප්‍රචාරය කර ඇත. ඇමරිකාවට ලංකාව වැනි රටවල් ප්‍රවෘත්ති වන්නේ එවැනි ආපදාවලට මුහුණ දෙන විට පමණය. කෙසේ හෝ වේවා ඒ බී සී නාලිකාව ඒ ප්‍රවෘත්තිය ප්‍රචාරය කර ඇත්තේ ලංකාවේ සිතියම කොටි ලාංඡනය හා කොටි කොඩිය ඇතිවය. මේ සම්බන්ධයෙන් දැනටමත් ඇමරිකා එක්සත් ජනපදයේ සිටින සිංහලයන් විශාල පිරිසක් චෝදනා හා පැමිණිලි ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නය වන්නේ මෙවැන්නක් සිදු වූයේ කෙසේද යන්නය.

ලෝකයේ අනෙක් රටවල ජීවත්වන කුඩා දරුවන් වුවද ඇමරිකාව ගැන දත යුතු නමුදු ඇමරිකාවේ ප්‍රවෘත්ති සංස්කාරකයන් ප්‍රවෘත්ති කියවන්නන් ආදීන් අනෙක් රටවල් ගැන එතරම් විස්තර දැන ගත යුතු නොවේ. මේ සිද්ධිය නොදැනුවත්කම නිසා සිදු වුවක්ද එසේත් නැත්නම් දැනුවත්ව වුවක්දැයි නිශ්චිතව කිව හැකි නොවේ. කෙසේ වෙතත් ඒ. බී. සී රූපවාහිනිය පමණක් නොව ඇමරිකන් ආණ්ඩුවද ලංකාවේ එහි නියෝජිතයා වූ විල්ස් ද මේ සම්බන්ධයෙන් ලංකාණ්ඩුවෙන් හා ජනතාවගෙන් විශේෂයෙන්ම සිංහලයන්ගෙන් සමාව අයැදිය යුතුය. ලංකාවේ සෑම ක්‍රියාදාමයකදී ම පාහේ තොරතෝංචියක් නැතිව කතාකරන විල්ස් මේ සම්බන්ධයෙන් නිහඬය.

ඒ. බී. සී රූපවාහිනියේ වැරැදි ප්‍රචාරයට ඉඩ ලැබෙන්නේ සමහර විට ඇමරිකානුවන්ගේ අඥානකම නිසා විය හැකිය. අනෙක් පැත්තෙන් කොටි රූප හා ලාංඡන කාගේ හෝ ඇසකට හසු නොවන අවස්ථාවක් බලා දෙමළ ජාතිවාදියකු හෝ දෙමළ ජාතිවාදයට පක්ෂ අයකු හෝ ප්‍රවෘත්ති ප්‍රචාරයට ලබා දුන්නා විය හැකිය. මේ සම්බන්ධයෙන් ලංකාණ්ඩුව ගන්නා පියවර කුමක්ද? රටේ ජාතික කොඩිය හා ජාතික ලාංඡනය වෙනුවට ත්‍රස්තවාදී කල්ලියක කොඩිය හා ලාංඡනය විකාශය වීමෙන් පසුව වගකිවයුතු හා අදීන ආණ්ඩුවකට නිහඬව සිටිය නොහැකිය. එහෙත් මෙරටට ඇත්තේ වගකිවයුතු හා අදීන ආණ්ඩුවක් නොවේ. ඔවුහු ඇමරිකාව කියන්නේ කුමක්ද ඒ දෙය කිරීමට සූදානම් ව සිටිති.

© Prof. Nalin De Silva

ඇමරිකාව කොට්න්ට පක්ෂව කටයුතු කරන බව නොදන්නා තවත් පිරිසක් ඇත්නම් ඒ මෙරටට ඇති ඊනියා වාමාංශික පක්ෂවල නායකයෝ වෙති. ඔවුන්ට ඇමරිකාවේ සංස්කෘතික යටත්විජිතවාදය නොපෙනෙයි. ඒ කාල් මාක්ස් ද අංක එකේ සංස්කෘතික යටත්විජිතවාදියකු වූ නිසාය. මෙරට ඇති ඊනියා සටන් විරාම නිරීක්ෂණ කමිටුව කොට්න්ට විරුද්ධව ක්‍රියා නොකරයි. සටන් විරාම නිරීක්ෂණ කමිටුව මුළුමනින්ම ස්කැන්ඩිනේවියානු රටවල නියෝජිතයන්ගෙන් සමන්විත වෙයි. එහි ප්‍රධානියා නෝර්වේ ජාතිකයෙක් වෙයි. මේ කමිටුව ගැන අපට සත පහක විශ්වාසයක් නැත. එහෙත් ඉන් කියැවෙන්නේ කමිටුවේ සාමාජිකත්වය පුළුල් කර ඉන්දියාව වැනි රටවල්ද කමිටුවට කැඳවා ගත යුතු බව නොවේ. කළ යුත්තේ ඊනියා සටන් නිරීක්ෂණ කමිටුව වර්ජනය කිරීමය. ඒ අතර ඇමරිකාවේ ක්‍රියාදාමය හෙළිදරවු කිරීමය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva